නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!

# ධම්මපදය

## චිත්ත වර්ගය (06-07 ගාථා)

**6. ගාථාව**

**අනවට්ඨිතං චිත්තස්ස - සද්ධම්මං අවිජානතෝ,**
**පරිප්ලව පසාදස්ස - පඤ්ඤා න පරිපූරති.**

පදගතාර්ථය

| | |
|---|---|
| **අනවට්ඨිතං චිත්තස්ස** | - චපල වූ සිත් ඇත්තාට, |
| **සද්ධම්මං** | - තථාගතයන් වහන්සේ දෙසූ ශ්‍රී සද්ධර්මය (සත්තිස් බෝධිපාක්ෂික ධර්ම), |
| **අවිජානතෝ** | - නො දන්නා හට, |
| **පරිප්ලව පසාදස්ස** | - ඉපිලෙන සැදැහැ ඇත්තහුට, |
| **පඤ්ඤා න පරිපූරත** | - ප්‍රඥාව නො පිරේ, |

භාවාර්ථය

චපල වූ සිත් ඇති, සදහම් නො දන්නා වූ, ඉපිලෙන සැදැහැ ඇත්තහුට නුවණ නො පිරේ.

**7. ගාථාව**

**අනවස්සුත චිත්තස්ස - අනන්වාහත චේතසෝ,**
**පුඤ්ඤපාපපහීණස්ස - නත්ථි ජාගරතෝ භයං.**

පදගතාර්ථය

| | |
|---|---|
| **අනවස්සුත චිත්තස්ස** | - රාගයෙන් තෙත් නො වූ සිත් ඇති, |
| **අනන්වාහත චේතසෝ** | - ද්වේෂයෙන් නො පහරණ ලද සිත් ඇත්තහුට, |
| **පුඤ්ඤපාපපහීණස්ස** | - නැසූ පින් පවු ඇත්තහුට, |
| **නත්ථි ජාගරතෝ භයං** | - නො නිදන්නාහට බියක් නැත, |

භාවාර්ථය

රාගයෙන් තෙත් නො වූ සිත් ඇති, ද්වේෂයෙන් නො පහරණ ලද සිත් ඇති, පින් පවු නැසූ, කෙලෙස් නින්දෙන් නො නිදන්නාහට බියක් නැත්තේ ය.

නිදන කථාව

සැවැත් නුවර වැසි එක් කුලපුත්‍රයෙක් පලාගිය ගොනෙකු සොයමින් වනයට ගියේ ය. එහි පෙරවරුවෙහි සොයා ඇවිද ඉර මුදුන් වේලෙහි ගොනා දැක අල්ලා ගෙන ඌ ගවයන් සිටි තැනට යැවී ය. තෙමේ බඩගිනි ඉවසා ගත නො හැකි ව බත් ටිකක් අනුභව කරමි' යි සිතා අසල තිබූ විහාරයට ගියේ ය. ගොස් භික්ෂූන් වැඳ එකත් පසෙක හුන්නේ ය. එවේලෙහි එහි ඉඳුල් ලන බඳුනෙහි වළඳා ඉතිරි වූ බත් තිබුණේ ය.

භික්ෂූන් වහන්සේලා බඩසයින් පෙලුණු ඔහු දැක "මේ තැටියෙන් බත් ගෙන කව" යි තැටිය තිබූ තැන පෙන්වූහ. බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි භික්ෂූන් වහන්සේට නොයෙක් මාලුපිණියෙන් යුත් බත් ලැබුණේ ය. ඔහු ඒ තැටියෙන් බත් ගෙන කා පැන් බී අත් සෝද ගෙන භික්ෂූන් වෙත ගොස් වැඳ "ස්වාමීනී, අද දනයට පැවරූ තැනකට වැඩියෝ දැ" යි කියා ඇසී ය. "නැත, අපට සැමද ම මේ ලෙසට ආහාර ලැබේ" ය යි භික්ෂූන් වහන්සේලා කීහ. 'අප රෑ දවල් වීර්යයෙන් රැක-රක්ෂා කරන්නේ නමුත් කිසි දිනක කුස පුරා මේ ආකාරයේ රසවත් ආහාර කන්නට නො ලැබේ. මේ භික්ෂූහු දිනපතා සැම වේලේ ම මෙසේ රස-ගුණ බොජුන් වළඳති. එනිසා මමත් මහණ වෙමි' යි සිතා භික්ෂූන් වෙත ගොස් පැවිද්ද ඉල්ලා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා ඔහු පැවිදි කළහ. පැවිදි වූ ඔහු ලැබූ උපසපන් බව ඇත්තේ වත්පිළිවෙත් කරමින් බුදුරජාණන් වහන්සේට උපන් ලාභ සත්කාර වළඳන්නේ කිහිප දිනකින් ම තරබාරු සිරුර ඇත්තේ විය. එහෙත් පිඬු සිඟා යාම කරදරයකැ' යි සිතූ ඔහු 'මහණකමින් වැඩක් නැතැ' යි සිතා සිවුරු හැර ගියේ ය. නැවත ගිහි කටයුතුවලට බැසීමෙන් ඔහුගේ සිරුර වැහැරී ගියේ ය. මේ ගිහි කමින්වැඩක් නැතැ' යි සිතා ඔහු නැවත ගිහිගෙය හැර දමා පැවිදි වූයේ ය. සිරුර තරබාරු වූ

පසු නැවතත් සිවුරු හැරියේ ය. මොහු පැවිදි ව සිටින කල්හි භික්ෂූන්ට නොයෙක් අතින් උපකාර කරන්නේ ය.

මෙලෙස නැවත වරක් වෙහෙරට ගොස් මහණකම ඉල්ලී ය. භික්ෂූහු එවරත් උපකාර පිණිස ඔහු පැවිදි කළහ. මෙසේ මේ තෙමේ සයවරක් පැවිදි ව සිවුරු හැර ගියේ ය. එහෙයින් 'මොහු සිතට වසඟ ව හැසිරේ ය' යි කියා ඔහුට 'චිත්තහත්ථ' යි නම් කළහ. වරක් ගිහි ව ද වරක් පැවිදි ව ද දවස් යවන මොහුගේ බිරිඳ ගර්භනී වූවා ය. මොහු සත්වන වර ද වනයෙන් නගුල් වියදඬු ආදි සාන උපකරණ රැගෙන ගෙට අවුත් ඒ උපකරණ තැන්පත් කොට තබා 'සිවුරු ගන්නෙමි' යි සිතා කාමරයට ඇතුළු විය. ඒ වේලෙහි බිරිඳ වැතිර නිදා හුන්නා ය. ඉණ ඇඳි රෙදිකඩ ද සිරුරෙන් පහ ව තිබුණේ ය. කට දෙකොනින් කුණු කෙළ වැගිරුණේ ය. බිරිඳ දුටු විට ම ඇය ඉදිමී ගිය මළසිරුරක් සේ ඔහුට වැටහුණි. 'අහෝ, මේ සියල්ල අනිත්‍ය යි, දුක යි, මට මැය නිසා පැවිදි ව සිටිනු නො හැකි විය' යි යනුවෙන් සිතන්නට වූ හෙතෙම සිවුරු කොන ගෙන අඟෙහි දවටා ගනිමින් ම ගෙයින් නික්ම ගියේ ය. ඔහු වෙහෙර දෙසට යනු දුටු ඔහුගේ නැන්දනිය කරුණු සොයා බැලීම සඳහා ගෙට ඇතුළු විය. එවිට දියණියගේ මේ නො මනා හැසිරීම දුටු ඇය තම දියණියට බැණවැදුනා ය. දැඩි වූ කලකිරීමෙන් තිලකුණු මෙනෙහි කරමින් වෙහෙර කරා යන අතරමග දී ම ඒ පුරුෂයා සෝතාපන්න වූයේ ය. හෙතෙම භික්ෂූන් වෙත ගොස් වැඳ මහණකම ඉල්ලා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා ඔහු පැවිදි කිරීමට අකමැති වූ කල්හි "ස්වාමීනී, මා තව එක්වරක් පැවිදි කරනු මැනව" යි තදින් කියා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා එවර ද ඔහු පෙර කළ උපකාර සලකා පැවිදි කළහ. ස්වල්ප දිනකින් ඒ භික්ෂූන් වහන්සේ සිවුපිළිසිඹියාවන් ලබා රහත් වූ සේක. භික්ෂූන් වහන්සේලා "චිත්තහත්ථ ය, ඔබ මෙවර සිවුරු හැරීම කල් යවන බව පෙනේ" ය යි කීහ. "ස්වාමීනී, ඒ එදා ය. අද මම සසර ඇලුම් - සසර බැඳුම් නැති කළෙමි. එහෙයින් දැන් ගිහිගෙට නො යමි" යි යනුවෙන් චිත්තහත්ථ ස්වාමීන් වහන්සේ පැවසූ සේක. එවිට භික්ෂූන් වහන්සේලා මෙම භික්ෂුවගේ කථාව බුදුරජාණන් වහන්සේට සැල කළහ. බුදුරජාණන් වහන්සේ චිත්තහත්ථ භික්ෂුව අරහත්වයට පත් ව ඇති බව වදාළහ. "මහණෙනි, මා පුත් සැලෙන සිත් ඇති සමයේ, දහම් නො දන්නා සමයෙහි ඒ ඒ තැන යැම්-ඊම් කළේ ය. දැන් ඔහුට පිනුත් නැත. පවුත් නැත. ඒ දෙක ම පහ ව ගියේ ය" යි වදරා මේ ධර්ම දේශනාව වදාළ සේක.

සාධු **!** සාධු **!!** සාධු **!!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය,**
**උග්ගල්බොඩ, ගම්පහ.**
**Tel: 077-3811301 / 071-4417813**
**Email: info@sadaham.net**
**( වප් 2553)**

**__සම්පාදක:__** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ ප්‍රධාන
අනුශාසක අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේ

**__ධර්මදානය:__** පින්වත් සනත් කොඩිතුවක්කු උපාසක මහතා, සත්මි දියණිය සහ රසිකා මාලගේ මහත්මිය විසින් මාතර, හිත්තැටිය (නැගෙනහිර) පදිංචි ව සිට අභාවප්‍රාප්ත වූ දයාපාල කොඩිතුවක්කු පියාණන්ට සහ ධර්මාවතී ලියනගේ මැණියන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස සහ තමන්ට ධර්මාවබෝධය පිණිස මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**